# දැන්වීමයි

## තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයට අයත් නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානයේ

**ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ කාර්ය සහයක (දෙපාර්තමේන්තුගත) තනතුරු 07 ක් සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

| | | | |
|---|---|---|---|
| 01. | තනතුර | : | කාර්ය සහායක (දෙපාර්තමේන්තුගත) |
| 02. | තනතුරේ ස්වභාවය | : | ස්ථිර විශ්‍රාම වැටුප් සහිත (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය) |
| 03. | සේවා ගණය | : | ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය (PL 01-2025) |
| 04. | වැටුප් පරිමාණය | : | රු. 40,000 - 10 x 450 - 10 x 490 - 10 x 540 - 12 x 590 - 61,880/- |
| 05. | අධ්‍යාපන සුදුසුකම් | : | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත්ව තිබීම. |
| 06. | කායික සුදුසුකම් | : | යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය. |
| 07. | වයස | : | අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු. 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ සිටින ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීම්ලාභීන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ. |
| 08. | බඳවා ගැනීමේ ක්‍රමය | : | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය |
| 09. | බඳවා ගන්නා ශ්‍රේණිය | : | බඳවාගනු ලබන්නේ කාර්ය සහායක iii වන ශ්‍රේණිය සඳහා පමණි. |

තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය මත අයදුම්කරුවන්ගේ මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනයේදීම පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකදී අයදුම්කරුවන් ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුගමනය කරමින් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් කාර්ය සහායක iii ශ්‍රේණියට පත් කරනු ලැබේ.

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 |
| අදාල ක්ෂේත්‍රය පිළිබඳ දැනුම | 35 |
| වෘත්තීය සුදුසුකම් | 20 |
| පළපුරුද්ද | 20 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 |
| **එකතුව** | **100** |

**සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :**

10.1 මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් අයදුම්කරු විශ්‍රාම යන තෙක් මෙම මධ්‍යස්ථානයේ සේවය කළ යුතුය.

10.2 සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදළ සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන දිනයේ හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

10.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්, පවතින පුරප්පාඩු සඳහා පත් කරනු ඇත.

10.4 නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානයේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ කාර්ය සහායක තනතුර සඳහා පුරප්පාඩු 07 කි. පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් තිශ්චය කරනු ලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

10.5 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිත්හි V වෙනි පරිච්ඡේදය අනුව රජයේ සේවයට පත් කරනු ලැබීමට නුසුදුසු තැනැත්තෙකු නොවිය යුතුය.

11. **අයදුම් කරන ආකාරය :**

11.1 A4 ප්‍රමාණයේ කඩදසි භාවිතා කර මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව අයදුම්පත සකස් කළ යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍රත්, අසම්පූර්ණ අයදුම්පත්‍රත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11.2 අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"කාර්ය සහායක iii වන ශ්‍රේණියට බඳවා ගැනීම"** යන්න සඳහන් කරන්න.

11.3 නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය පහත සඳහන් දිනට පෙර **අධ්‍යක්ෂ, නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය, යෝධගම, ඇඹිලිපිටිය** ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

11.4 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය : **2026.04.07**

11.5 මෙම නිවේදනයේ සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නියමිත දිනට හෝ එදිනට පෙර අයදුම්පත් ඉදිරිපත් කර ඇත්තේ නම් පමණක් තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහෙත් එසේ කැඳවීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වීමට සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ මෙම නිවේදනය අනුව අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

11.6 **මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව** තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

**ඒ.එච්.එම්.යූ. අරුණ බණ්ඩාර**
**ලේකම්,**
**තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය.**